**ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2019**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**------**

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61 වගන්තිය යටතේ සාදන ලද 1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල් නියෝග මාලාවේ අංක 12 දරන නියෝගය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 ජූනි 17 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශයේ 6.5 වගන්තිය | ආයෝජන මණ්ඩල රෙගුලාසි යටතේ ඉදිකරන ලද සිනමා සංකීර්ණවල ප්‍රදර්ශනය කරනු ලබන එක් එක් ආනයනික චිත්‍රපටයක ප්‍රවේශ පත්‍රයකින් රු.2.25 හෝ මුළු ප්‍රවේශපත් ආදායමින් සියයට 2.25ක් හෝ යන දෙකින් වැඩි මුදල,අරමුදලට ලැබිය යුතු වුවත් 2001 වර්ෂයේදී ඉදිකරන ලද මරදාන සිනේ සිටි (Cine City) සිනමා සංකීර්ණයෙන් එලෙස අයවිය යුතු මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආරම්භයේ දී මෙම සිනමාහල චිත්‍රපට කුලිය හා භාරය ගෙවීම් කල අතර මේ වන විට දෛනික වාර්තා පවා සංස්ථාවට ඉදිරිපත් කරනු නොලබයි. | චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශයේ 6.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 1996 ඔක්තෝබර් 24 දින අංක 9/946දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1996 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා(විවිධ ගාස්තු) නියෝග | | | |
| | (i) 4 වගන්තිය | ආනයනය කරනු ලැබූ චිත්‍රපටයක් ප්‍රදර්ශනය කරන අවස්ථාවක දී අයකරන ගාස්තුවලට (Levy) අමතරව ''යූ'' ගණයේ චිත්‍රපටියක් සඳහා ප්‍රවේශ පත්‍රයකින් එක් රුපියලයක් ද,''එක්ස්'' ගණයේ | අදහස් දක්වා නොමැත | චිත්‍රපට සංස්ථාවේ (විවිධ ගාස්තු) නියෝග ප්‍රකාරව අමතර ගාස්තු අයකර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සහ "වැඩිහිටියන්ට වඩා සුදුසුයි" යන ගණවල චිත්‍රපට සඳහා ප්‍රවේශ පත්‍රයකින් රුපියල් තුනක් අයකර ගත යුතුයි. එම මුදල් සිනමා ශාලාවේ අයිතිකරුගෙන් හෝ බදු ගැනුම්කරුවන්ගෙන් අරමුදලට ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ii) 2(4)(i)(ඉ) වගන්තිය | චිත්‍රපටිවල උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීම සඳහා වර්ෂ 09 ක කාලයක සිට කටයුතු කර නොතිබුණි. | මේ වන විට පත්ව ඇති පාලක මණ්ඩලය සමඟ ඉදිරියේදී මෙම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | චිත්‍රපට ප්‍රමිතිය උසස් කිරීම සඳහා නිෂ්පාදනයට හා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය උපකරණ සැපයීම කළ යුතු වීම. |
| (iii) 2(4)(i)(ඊ) වගන්තිය | චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින කලාකරුවන්ට සහ කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩසටහන් ඇති කිරීම උදෙසා අරමුදල කටයුතු කර නොතිබුණි. | -එම- | කලාකරුවන්ට හා කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව හෝ පුහුණු වැඩසටහන් ඇති කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (iv) 2(4)(i)(උ) වගන්තිය | උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට මුළුමනින්ම නිෂ්පාදනය කිරීම සඳහා තිර රචනා ඇගයීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබූ තිර රචනා හෝ එවැනි චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ලබාගත හැකි ප්‍රභවයකින් විශේෂ උපකරණ කුලියට ලබාගැනීම පිණිස අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් දීම මගින් චිත්‍රපට නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා වර්ෂ ගණනාවක සිට කටයුතු කර නොතිබුණි. | -එම-. | උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට හෝ තිර රචනා ඇගයීමේ කමිටුව ඇගයීම් කරන චිත්‍රපට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය උපකරණ කුලියට ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් ලබා දී එවැනි නිෂ්පාදන ප්‍රවර්ධනය කළ යුතු වීම. |
| (v) 2(4)(i)(ඌ) වගන්තිය | වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුනතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය මුදල් | -එම- | අවුරුදු 5 ක් හෝ ඊට වැඩි වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුණතා වැඩිකර ගැනීමට හා දියුණු කර ගැනීමට ණය ලබා දිය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිකුත් කිරීමට 2013 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | | |
| | (vi) 6 (ඇ) වගන්තිය | ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාර පාලක මණ්ඩලය විසින්නිශ්චය කර අයකර ගතයුතු වුවත්, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සිනමාශාලා හිමියන් වෙත ප්‍රදානය කර තිබූරු.71,951,386ක ණය මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් අයවිය යුතු අධිභාර නිශ්චයකර ඒවා අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2015 ඔක්තෝබර් 23 දිනැති අංක 3/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | 2013 වර්ෂයේ මහජන බැංකුවේ ආරම්භ කර තිබූ ජංගම ගිණුමේ 2019 දෙසැම්බර් 31 දින වනවිට රු.22,643 ක ශේෂයක් පැවතුණු අතර මෙම අක්‍රිය ජංගම ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට අක්‍රියව පැවතීම කරන කොටගෙන පාලක මණ්ඩල අනුමැතියෙන් ගිණුම වසා දැමීමට කටයුතු කරනු ලැබේ. | සංවර්ධන අරමුදලෙන් ගෙවීම සඳහා ප්‍රධාන ජංගම ගිණුම පවත්වාගෙන අක්‍රිය ජංගම ගිණුම වසා දැමීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,789,214ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,720,551 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,931,337ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විදේශ චිත්‍රපට රූගත කිරීමේ අනුමත ගාස්තු ආදායම රු.1,500,000කින් හා විදේශ කාර්මික ශිල්පීන් සඳහා ලැබීම් රු.992,000කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වර්ෂ 5 සිට වර්ෂ 25 ක් දක්වා කාල පරාසයක සිට පැවත එනරු.67,001,194ක් වූ ණයගැති ශේෂඅයකරගත නොහැකි ණය ලෙස හඳුනාගෙන තිබුණු අතර, එම ණයශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙහි ඇතැම් ණය සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීමට ලිපි ගොනු ඉදිරිපත් කලද කාලාවරෝදයට අසුවීම නිසා එයද නොහැකි බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිලිබඳව පාලක මණ්ඩලයෙන් විමසා කටයුතු කරනු ලබයි. | මෙම ණය මුදල් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අරමුදලෙහි ප්‍රධාන ආදායම් මාර්ගය වන චිත්‍රපට කුලී දායකත්වය ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවෙන් අයකර ගත යුතු වුවත්, 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2019 දෙසැම්බර් 31දින වනවිට අයවිය යුතු හිඟ මුදල රු.26,561,790 ක් විය. | සංස්ථාවේ මූල්‍ය තත්වය දුර්වල වීම හේතුවෙන් මෙම මුදල් සංවර්ධන අරමුදල වෙත ලබාදිය නොහැකි වී ඇත. හිඟ මුදල් අය කර ගැනීමට සිනමාශාලා හිමියන් දැණුවත් කර ඇති අතර ඉදිරියේදී මෙම මුදල් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | චිත්‍රපට කුලී දායකත්වය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2001 හා 2002 වර්ෂවලදී පිල්ම් ලංකා නැමති සමාගමට මරදාන සිනේසිටි සිනමා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු හා උපකරණ මිලට ගැනීම සඳහා ලබා දී තිබූ රු.මිලියන 8.5ක ණය මුදල, ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර, 2019 දෙසැම්බර් 31 දින වනවිට තවදුරටත් රු.890,655ක් අයකරගත යුතුව පැවතුණි. මෙම ණය මුදල සඳහා 2006 වර්ෂය දක්වා ලැබිය යුතු පොළී වටිනාකම රු.4,064,958 ක් ලෙස ගණනය කර තිබූ අතර, ඉන් පසු වර්ෂ සඳහා ලැබිය යුතු ණය පොළී ප්‍රමාණය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ණය මුදල් නොගෙවීම නිසා පොළිය ගණනය කිරිමෙන් නොලැබුණු ආදායම්, ගිණුම් ප්‍රකාශනවල පෙන්නුම් කරන හෙයින් 2006 දක්වා පමණක් පොළිය ගිණුම් ගත කර ඇත. | සිනෙසිටි සිනමා සංකීර්ණය ඉදිකිරීමට අදාළ ණය ගිවිසුම ප්‍රකාරව 2019 වර්ෂය දක්වා පොලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | වැකන්ද වලව්ව චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු සඳහා ලබා දී තිබුණු ණය මුදල් හා ඊට අදාල පොළිය 2019 දෙසැම්බර් 31 දිනට රු. 3,525,795ක් වූ අතර එම චිත්‍රපටයේ අයිතිය ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව සතු වුවද වරින් වර මෙම චිත්‍රපටය රූපවාහිනිය මගින් ප්‍රදර්ශනය කර තිබුණි. කෙසේ වෙතත් එම ප්‍රදර්ශන ආදායම චිත්‍රපට සංවර්ධන අරමුදලට ලබාගෙන නොතිබුණි. | මෙම චිත්‍රපටයට අදාළව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, චිත්‍රපට සංවර්ධන අරමුදල හා තැප්‍රොබේන් පික්චර් (පෞද්) සමාගම වශයෙන් පාර්ශව 03 ක් සම්බන්ධව ගිවිසුමකට එළඹ තිබූ බැවින් රූපවාහිනි ප්‍රදර්ශණ අයිතිය සම්බන්ධයෙන් නීතිමය තත්වය පැහැදිලි කර ගැනීමට මේ වන විට නීති අංශය වෙත යොමුකර ඇත. | චිත්‍රපට සංස්ථාවේ සංවර්ධන අරමුදලට අයිති චිත්‍රපට විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රදර්ශනය කිරිමේදි ප්‍රදර්ශන කුලී ආදායම සංවර්ධන අරමුදලට ලබා ගත යුතු වීම. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල සතු බැංකු ජංගම ගිණුමේ 2019 වර්ෂයේ සාමාන්‍ය මාසික ශේෂය රු.මිලියන 9.4 ක් වූ අතර එම මුදල් ඵලදායී ලෙස කෙටි කාලීනව ආයෝජනය කර අමතර ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී වඩාත් ඵලදායි අයුරින් ආයෝජනය කිරිමට සහ අරමුණු ඉටුකර ගැනිමට කටයුතු කිරිමට අපේක්ෂිතය. | මෙම අරමුදලේ එදිනෙදා අවශ්‍ය කාරක ප්‍රාග්ධනයට අදාල මුදල් රඳවාගෙන ඉතිරි මුදල් කෙටිකාලීනව ආයෝජනය කළ යුතු වීම. |